055295
ML/PR
2017/09/08

# ශ්‍රී ලාංකේය ප්‍රාසංගික නර්තනය සඳහා රංග කලා තාක්ෂණය

055295

DD/MA/DA/11/026

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
පුස්තකාලය

# හැඳින්වීම

ප්‍රාසංගික නර්තනය යනු ප්‍රායෝගික විෂයකි. එය මිනිසාගේ සංවේදී භාවයන් රසයන් උලුප්පමින් ඇස හා කණ පිනවමින් මනසට ගෝචර කලාවකි. නර්තනය මිනිසාගේ මානසික සුවය සලසන කලාවක් හෙයින් එය සමාධි ගත වීමක් යැයි දැක්වීම වැරදි නැත. ප්‍රේක්ෂකයාට හැඟීමක් වින්දනයක් දනෙන පරිදි වේදිකාව මත නර්තන ශිල්පීන් /ශිල්පිණියන් ඉදිරිපත් කරන ප්‍රාසංගික නර්තනය පිළිබඳවත් ඒ හා බැඳුණු තාක්ෂණික අංග පිළිබඳවත් මෙම පර්යේෂණ නිබන්ධිකාවෙන් සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී නර්තනයක් නිර්මාණය කිරීම සඳහා නර්තන රචකයකු විසින් ආරම්භයේ සිට අවසානය දක්වා නර්තන ශිල්පීන් ශිල්පිණියන්ගේ හා අනුෂාංගික ශිල්පීන්ගේ හා තාක්ෂණික අංගයන්ගේ දායකත්වය ගොනු කරන ආකාරයත් ඔවුනොවුන් අතර එකිනෙකාගේ සහසම්බන්ධතාව ඇති කර ගන්නා ආකාරයත් පර්යේෂණ නිබන්ධනයෙන් සාකච්ඡා කෙරේ. ප්‍රාසංගික කලාව අතීතයේ සිට ක්‍රමිකව විකාශනය වෙමින් පැවත ආ කලාවකි. එය කවදා කෙසේ ඇති වූයේ දැයි නිශ්චිතව සඳහන් කළ නොහැක. නමුත් පුද්ගලයින් තුළ ඇති වන සෞන්දර්ය රස භාව, ශරීර චලන, ප්‍රකාශන ආදී සංකල්පයන්හි වෙනස්වීම් වල ප්‍රතිඵලයක් ලෙස එය බිහි වූ බව කිව යුතුය. කරලිය කරා ගමන් ගත් දිනයේ සිට ප්‍රාසංගික කලාව ඉදිරිපත් කිරීමේ හා ප්‍රේක්ෂකයින්ගේ ඇස, කණ, මනස පිනවීමේ කලාව ලෙස හැඳින්වීමට පිළිවන.

පූර්ව පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් වංශ කතා, සංදේශ කාව්‍ය, විදේශ වාර්තා, ජනප්‍රවාද ආදී මූලාශ්‍රයන් පරිශීලනය කෙරේ වැඩි අවධානයක් යොමු කරමින් එහි වූ මූලික සංකල්ප පදනම් කොට ගෙන කලා ශිල්ප ආදී මූලාශ්‍රයන් පවතින ස්ථාන ආශ්‍රිතව ක්ෂේත්‍ර ගවේෂණය සිදු කිරීම මෙහිදී විශේෂ වේ.

මෙම නිබන්ධිකාවේ පළමු පරිච්ඡේදය වෙන්වී ඇත්තේ ලාංකේය නර්තනයේ ප්‍රභවය හා විකාශය පිළිබඳවය. විශේෂයෙන්ම මෙහිදී නර්තනය ලංකාව තුළ බිහි වීමට බලපෑ ඓතිහාසික පසුබිම පිළිබඳවත් විමසා බැලේ. එමෙන් ලාංකේය නර්තනය ප්‍රධාන වශයෙන් උඩරට, පහතරට, සබරගමු ලෙස කොටස් තුනකට බෙදීමත් ඒ හා බැඳුණු සමාජ පසුබිමත් විමර්ශනාත්මකව අධ්‍යනය කෙරේ. ලාංකේය නර්තනයේ අව්‍යාජත්වය හෙළි කරනුයේ ගැමි නර්තනය තුළිණි. සරල බව, සාමූහික බව ගැමි නර්තනයේ මුඛ්‍ය පරමාර්ථය වූවා සේම ප්‍රාසංගික නර්තනයේ ආරම්භක අවධිය නොඑසේ නම් මූල බීජය ද ගැමි නර්තනය සේ හඳුන්වා දීම යුක්ති යුක්ත වන්නේය. නර්තනයේ දී ප්‍රධානතම ප්‍රකාශන මාධ්‍ය චලනයයි. ඒවා අර්ථාන්විත හා භාවාත්මක වේ. අදහස් ආකල්ප ආදිය සංයෝග කරමින් නැවත ප්‍රතිනිර්මාණය කිරීම නිර්මාණ කාර්යයේ දී සිදු වේ. උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් ආශ්‍රිතව නිර්මාණ නර්තනය වේදිකාවට පිවිසීම පිළිබඳව ද මෙහි දී සාකච්ඡාවට බඳුන් වෙයි.

දෙවන පරිච්ඡේදය තුළ ප්‍රාසංගික නර්තනය පිළිබඳ සාකච්ඡා කිරීමට ඉඩ කඩ වෙන් වේ. ප්‍රාසංගික නර්තනය බිහි වූයේ කෙසේ දැයි සහ එහි සිදු වූ ක්‍රමික විකාශනය පිළිබඳ සොයා බැලීම මෙහි දී විශේෂයෙන් සිදුවේ. ප්‍රාසංගික නර්තනය සඳහා නර්තන රචනය කරන්නේ කෙසේදැයි සහ ඒ හා බැඳුණු අනුෂාංගික අංග සහ ශ්‍රී ලාංකේය ප්‍රාසංගික නර්තනය ප්‍රවර්ධනය සඳහා දායක වූවන් පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යනය කිරීමත් දශක කිහිපයක් තුළ සිදුවූ ප්‍රාසංගික නර්තනයේ ශ්‍රී ලාංකේය ගමන පිළිබඳව විමසා බැලීම ද සිදුවේ.

තෙවන පරිච්ඡේදය තුළ ප්‍රාසංගික නර්තනයට අවශ්‍ය වන්නා වූ තාක්ෂණික අවශ්‍යතාවයන් පිළිබඳ පිරික්සීම සිදුවේ. එතැන දී වේදිකාව, රංග වස්ත්‍රාභරණ පිළිබඳ පිරික්සීම සිදුවේ. එකී වස්ත්‍රාභරණවල ගැළපීම පිළිබඳව මෙන්ම විශේෂයෙන් ම ප්‍රාසංගික නර්තනයේ දී වඩා වැදගත් කැපී පෙනෙන සේ ම අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකන්නා වූ අංග රචනා කලාව පිළිබඳව ද කරුණු විමර්ශනය කෙරේ. විශේෂයෙන් ම මෙහිදී අංග රචනය ප්‍රාසංගික වේදිකාවට උචිත අයුරින් සිදු කරනුයේ කෙසේද ඒ සඳහා වර්ණ භාවිත වන්නේ කෙසේද ආදී කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලැබේ. ප්‍රාසංගික නර්තනය වර්තමානය වන විට මේ තරම් වූ දුරක් පැමිණ තිබෙන්නේ දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ ය. එනම් ප්‍රාසංගික නර්තනය ඉහලට ඔසවා තැබීමට ජනමාධ්‍ය වැදගත් කර්තව්‍යයක නියැලෙමින් සිටී. ශ්‍රී ලාංකේය රූපවාහිනී මාධ්‍ය බිහි වීමේ සිට වර්තමාන රූපවාහිනී නාලිකා තුළ ප්‍රාසංගික නර්තනය භාවිත වන ආකාරයත් වත්මන් රියැලිටි කලාව කෙතරම් දුරට ප්‍රාසංගික නර්තනය හා බැඳී පවතින්නේ ද යන්න අධ්‍යනය කරනු ලැබේ.

හතර වන හෙවත් අවසාන පරිච්ඡේදය තුළින් ප්‍රාසංගික නර්තනයට ආලෝකයක් වන්නා වූ රංගාලෝකය, රංගාලෝක උපකරණ, වර්ණ තුළින් නර්තනයට අදහස් ලබා දීම, කැමරා චලන ඔස්සේ නර්තනයට ලබා දෙන දායකත්වය, ශබ්ද භාවිතය ආදිය මෙන්ම නූතන වේදිකාවට ප්‍රාසංගික නර්තනය පිවිසීමත් නර්තනයේ වත්මන් දියුණුවට බිහි වූ නව රංග ශාලා පිළිබඳවත් දීර්ඝව සාකච්ඡා කෙරේ. එමෙන් ම අවසාන වශයෙන් ප්‍රාසංගික නර්තනය සඳහා රංගකලා තාක්ෂණය කෙසේ උපකාර වේ දැයි විමසා බලයි.

කෙසේ නමුදු ප්‍රාසංගික නර්තනය සඳහා රංගකලා තාක්ෂණය තුළින් ලැබෙන්නේ මහඟු පිටිවහලකි. වර්තමානය වන විට ප්‍රාසංගික නර්තනය ඉතා වැදගත් අවශ්‍යතාවක් වී ඇත. ප්‍රායෝගික විෂයක් වූ මෙහි පර්යේෂණ කර තොරතුරු ලබා ගැනීමට ක්ෂේත්‍ර ගවේෂණ ඔස්සේ සහ ග්‍රන්ථ මූලාශ්‍ර මගින් ඒවා සනාථ කර ගැනීමට ගත් ප්‍රයත්නයක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය.